අ/ විද්‍යාදර්ශ මහා විද්‍යාලය (ජාතික පාසල)

පළමු වාර පරීක්ෂණය 2025- 10 ශ්‍රේණිය

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය - I

නම/විභාග අංකය :- ..... **කාලය: පැය 1/2 යි.**

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) අද වන විට ලෝකයේ විවිධ අවශ්‍යතා සඳහා ලෝහ වර්ග සුලභව භාවිතා කරයි. එහි ඉතිහාසය
(1) ක්‍රි. පූ.1000ට පමණ විහිදේ. (2) ක්‍රි. පූ. 2000ට පමණ විහිදේ.
(3) ක්‍රි. පූ. 4000ට පමණ විහිදේ. (4) ක්‍රි. පූ. 5000ට පමණ විහිදේ.

(02) මූලික වශයෙන් භාවිතයට ගන්නා ලෝහ ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේ ද?
(1) එකකට (2) දෙකකට (3) තුනකට (4) හතරකට

(03) අමිශ්‍ර නිෆෙරස් ලෝහයකි.
(1) චීනච්චිටි (2) යකඩ (3) තඹ (4) පිත්තල

(04) ලෝහයක ගැටෙන විට හඬ හඳුනාගත හැක්කේ, එහි
(1) භෞතික ගුණයන් යටතේ ය. (2) තාපීය ගුණයන් යටතේ ය.
(3) රසායනික ගුණයන් යටතේ ය. (4) යාන්ත්‍රික ගුණයන් යටතේ ය.

(05) වැඩි ම යකඩ ප්‍රතිශතයක් ඇති යපස් වර්ගයකි.
(1) සිඩරයිට් ය. (2) රතු හීමටයිඩ් ය. (3) මැග්නටයට් ය. (4) යකඩ කාබනේට ය.

(06) භංගුරත්වයෙන් වැඩි ම ලෝහයක් වන්නේ,
(1) යකඩ ය. (2) චීනච්චටිටි ය. (3) වානේ ය. (4) ටින් ය.

(07) දෙදිශාවකට අදින විට නොකැඩී දික්වූ ප්‍රමාණයට ස්ථිරව පැවතීමේ ගුණය ලෝහවල දැකිය හැක. මෙය හඳුන්වන්නේ,
(1) තන්‍යතාව වශයෙනි. (2) ආහන්‍යතාව වශයෙනි.
(3) ප්‍රත්‍යාස්ථතාව වශයෙනි. (4) සුවිකාර්යතාව වශයෙනි.

(08) මිශ්‍ර නිෆෙරස් ලෝහ සාදා ගැනීමේ දී තඹ හා ටින් ලෝහ මිශ්‍ර කර සාදාගන්නේ",
(1) ලෝකඩ ය. (2) ඇලුමිනියම් ය. (3) ඊයම් ය. (4) පිත්තල ය.

(09) මෙම රූපයෙන් දැ ක්වෙන්නේ,
(1) මයික්‍රොමීටරයයි.
(2) වර්නියර් කලපාසයයි.
(3) ඇතුළත කලපාසයයි.
(4) ස්වාය මට්ටමයි.

-01

(10) ලෝහයක් මත මැනුම් රේඛා සලකුණු කිරීමට භාවිත කරන්නේ,
(1) අඳින කටුව (2) මුළු මට්ටම (3) කපන කටුව (4) ඉහත සියල්ල ම

LIVEWORKSHEETS